# වාරිමාර්ග දෙපාර්තමේන්තුව
## நீர்ப்பாசனத் திணைக்களம்
## IRRIGATION DEPARTMENT
### (HYDROLOGY AND DISASTER MANAGEMENT DIVISION)

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation: 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax: 011-2591125
ලිපිනය / முகவரி / Address: 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ07.
230, த.பெ.1138,பௌத்தாலோக்கமாவத்தை, கொழும்பு 07,இலங்கை
230, P.O. Box 1138, Bauddhaloka Mawatha, Colombo 07.
දුරකථනය (පොදු) / தொலைபேசி (பொது) / Telephone (General): 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெயில் முகவரி / E-mail Address: ddhydrology@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் / Web site: www.irrigation.gov.lk


මගේ අංකය / எனது இல / My No.: DI/Hydro/103 (v)
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திக / Date: 2022/05/14

**පූර්ව ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදනය** **වර්ණය :ඇම්බර්**

**දිනය :** 2022/05/14 **- වේලාව : පෙ.ව. 11.00**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2022 මැයි 14 දින පෙ.ව. 5.30ට නිකුත් කරන ලද කාලගුණ අනතුරු ඇඟවීමේ නිවේදනයට අනුව දිවයිනේ සබරගමුව, බස්නාහිර, මධ්‍යම, සහ වයඹ පළාත්වලත් එමෙන්ම ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වලත් සමහර ස්ථාන වලට දිනකට මි.මී 150 ඉක්මවූ තද වර්ෂාපතනයක් ඇතිවිය හැකි බවට අනතුරු අඟවා ඇත. ඒ අනුව පහත **දක්වා ඇති ගංගා ද්‍රෝණි වලින් එකක හෝ කිහිපයක හෝ ගංගාවන් ආශ්‍රිත පහත් බිම් වල ගංවතුර තත්වයක් ඇතිවීම ඉදිරි දින කිහිපයේදී අපේක්ෂා කළ හැකිය**. මෙහිදී ඇති විය හැකි වර්ෂාවේ තීව්‍රතාවය හා ප්‍රමාණය මත ගංවතුර තත්ත්වයේ ප්‍රබලතාවය හා අවධානම රඳා පවතින බව කාරුණිකව දැනුම් දෙනු ලැබේ.

| | **ගංගා ද්‍රෝණිය** | **ගංවතුර අවධානමට ලක්විය හැකි ප්‍රදේශ** |
|---|---|---|
| 01 | දැදුරු ඔය ද්‍රෝණිය | මහව, වාරියපොල, නිකවැරටිය, කොබෙයිගනේ, රස්නායකපුර, බිංගිරිය, පල්ලම, ආරච්චිකට්ටුව සහ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල දැදුරු ඔය නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |
| 02 | මා ඔය ද්‍රෝණිය | පන්නල, දිවුලපිටිය, දංකොටුව, කටාන, වෙන්නප්පුව සහ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල අත්තනගලු ඔය නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |
| 03 | අත්තනගලු ඔය ද්‍රෝණිය | දිවුලපිටිය, මීරිගම, අත්තනගල්ල, ගම්පහ, ජා ඇල, මහර, කටාන, මිනුවන්ගොඩ සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල අත්තනගලු ඔය නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |
| 04 | කැළණි ගඟ ද්‍රෝණිය | රුවන්වැල්ල, දෙහිඕවිට, සීතාවක, දොම්පේ, කඩුවෙල, බියගම, හෝමාගම, කොළොන්නාව, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල කැළණි ගඟ නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |
| 05 | කළු ගඟ ද්‍රෝණිය | පැල්මඩුල්ල, නිවිතිගල, රත්නපුර, කුරුවිට, ඇළපාත, කිරි ඇල්ල, අයගම, ඇහැලියගොඩ, ඉංගිරිය, හොරණ, කලවාන, පාලින්දනුවර, බුලත්සිංහල, දොඩන්ගොඩ, මිල්ලනිය, කළුතර, මදුරාවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල කළු ගඟ නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |
| 06 | බෙන්තර ගඟ ද්‍රෝණිය | වලල්ලාවිට, බෙන්තර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල බෙන්තර ගඟ නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |

| | | |
|---|---|---|
| 07 | ගිං ගඟ ද්‍රෝණිය | නෙළුව, තවලම, නාගොඩ, ඇල්පිටිය, නියාගම, බද්දේගම, වැලිපිටිය, දිවිතුර, බෝපේ, පෝද්දල සහ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල ගිං ගඟ ගංවතුර නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |
| 08 | නිල්වලා ගඟ ද්‍රෝණිය | කොටපොළ, පිටබැද්දර, අකුරැස්ස, අතුරලිය, මාලිම්බඩ, කඹුරුපිටිය, තිහගොඩ සහ මාතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල නිල්වලා ගඟ ගංවතුර නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |
| 09 | කිරම ඔය ද්‍රෝණිය | වලස්මුල්ල, බෙලිඅත්ත සහ තංගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල කිරම ඔය ගංවතුර නිම්නය ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශ. |

මේ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිරන්තර විමසිල්ලෙන් පසුවන අතර ආපදා කළමනාකරණයට අදාල ආයතන වල සහ අදාල ප්‍රදේශවල මහජනතාවගේ අවධානය යොමුවිය යුතු බවද කාරුණිකව දන්වමි.






**ඉංජි. එස්.පී.සී. සුගීශ්වර**
වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ)

**ඇමුණුම -** ඉහත සඳහන් අනතුරු ඇඟවීම අනුව ගංවතුර අවදානමට ලක්විය හැකි ගංගා ද්‍රෝණි සිතියම අමුණා ඇත.

**වැසිදිය හසුරුවා සිරිලක සසිරිමත් කරමු**
மழைநீரைமுகாமைப்படுத்தலும் இலங்கையைசெழுமையூட்டலும்
**Manage Rain Water --- Make Sri Lanka Prosperous**

